සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

81 | S | I

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 11 - 2020

**කෘෂි හා ආහාර තාක්ෂණය - I -** කාලය : පැය 03 යි.

- සැලකිය යුතුයි:-
  - (i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  - (ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
  - (iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (✗) ලකුණ යොදන්න.
  - (iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

---

01. මින්නේරි දෙවියන් ලෙස දේවත්වයෙන් පුදන ලද රජතුමා වන්නේ,
(i) පරාක්‍රමබාහු රජතුමා ය. (ii) මහසෙන් රජතුමා ය.
(iii) වසභ රජතුමා ය. (iv) අග්බෝ රජතුමා

02. හරිත විප්ලවය මගින් සිදු වූ වෙනස්කම් කිහිපයක් පහත දැක්වේ.
A - කෘෂි රසායනික ද්‍රව්‍ය හඳුන්වා දීම
B - අතිරික්ත නිෂ්පාදන අලෙවි කිරීමට පියවර ගැනීම
C - පාරම්පරික බෝග ප්‍රභේද ආරක්ෂා කිරීම.
ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශ වන්නේ,
(i) A හා C පමණි. (ii) B හා C පමණි. (iii) A හා B පමණි. (iv) A, B හා C ය.

03. වර්තමානයේ දී දළ දේශීය නිෂ්පාදනයට ප්‍රධාන වශයෙන් දායකත්වය සපයන අංශවල අනුපිළිවෙල වන්නේ,
(i) සේවා අංශය > කර්මාන්ත අංශය > කෘෂිකාර්මික අංශය
(ii) කර්මාන්ත අංශය > සේවා අංශය > කෘෂිකාර්මික අංශය
(iii) කර්මාන්ත අංශය > කෘෂිකර්මාන්ත අංශය > සේවා අංශය
(iv) කෘෂිකාර්මික අංශය > සේවා අංශය > කාර්මික අංශය

04. රූපයේ දැක්වෙන උපකරණයෙන් මනිනු ලබන පරාමිතිය වන්නේ
(i) ආර්ද්‍රතාවයයි.
(ii) ආලෝකය පවතින කාලයයි.
(iii) ආලෝක තීව්‍රතාවයයි.
(iv) උෂ්ණත්වයයි.



05. පහත ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ
A - ශ්‍රී ලංකාව ප්‍රධාන දේශගුණික කලාප 3කට බෙදා වර්ගීකරණය කර ඇත.
B - සෑම ප්‍රධාන දේශගුණික කලාපයක් ම කෘෂි දේශගුණික කලාප 3කට බෙදා වෙන්කර ඇත.
C - ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප සංඛ්‍යාව 46කි.
(i) A හා B ය. (ii) B හා C ය. (iii) A හා C ය. (iv) ඉහත සියල්ලම ය.

06. බෝග වගාවට සුළඟේ හිතකර බලපෑමක් වන්නේ,
(i) පළිබෝධ ව්‍යාප්තියට ආධාර වේ. (ii) මඳ සුළඟ බෝග වල පරාගනයට දායක වේ.
(iii) පස මත ජල වාෂ්පීකරණය වැඩි කරයි. (iv) පත්‍ර ඉරී යයි. අස්වනු අඩු කරයි.

07. පහත ක්‍රියාවලිය මගින් පස නිර්මාණය වේ. මෙහි A හා B පිළිවෙලින් නම් කළ විට

පාෂාණ —A→ මාතෘ ද්‍රව්‍ය —B→ පස

(i) පාංශු ජනනය, පාෂාණ ජීර්ණයයි (ii) ඔක්සිකරණය, පාංශු ජනනයයි
(iii) ක්ෂීරණය, කීලේට කරණයයි (iv) පාෂාණ ජීරණය, පාංශු ජනනයයි.

08. පස තද වීම යනු, පස් අංශු අතර අවකාශ ප්‍රමාණය අඩු වී පස් අංශු ඉතා සමීප වීමයි. මෙය බෝග වගාවට හිතකර නොවේ. මෙයට ප්‍රධාන හේතුවක් වන්නේ,
(i) ජලය අවශ්‍ය ප්‍රමාණයට සම්පාදනය කිරීමයි.
(ii) තෙත පස මත නිරන්තරයෙන් යන්ත්‍රෝපකරණ ගෙන යාමයි.
(iii) අල බෝග වගා කිරීමයි.
(iv) පසට කාබනික ද්‍රව්‍ය එක් කිරීමයි.

09. පාංශු පුනරුත්ථාපනය සඳහා අනුගමනය **නොකරන** ක්‍රියාමාර්ගයක් වන්නේ,
(i) ආවරණ බෝග වගා කිරීමයි. (ii) පස තුළට ජලය කාන්දුවීම වැඩි කිරීමයි.
(iii) නිරන්තර බිම් සැකසීමයි. (iv) සමෝච්ඡ කානු යෙදීමයි.

10. සමෝච්ඡ රේඛා අනුව, සීසෑම හා වගා කිරීම මගින් බලාපොරොත්තු වන්නේ
(i) පස තුළට ජලය කාන්දු වීම වැඩි කිරීමයි.
(ii) පස මතුපිටින් ගලායන ජලයේ වේගය අඩු කිරීමයි.
(iii) වැසි බිංදු වේගයෙන් පස මත පතිත වීම අවම කිරීමයි.
(iv) බෝග ශාකවල මූල මණ්ඩලය වර්ධනය වීමට සැලැස්වීමයි.

11. පාංශු ඛාදනයේ දී සිදුවන ක්‍රියාවලි පිළිවෙලින් දැක්වෙන්නේ
(i) පස් අංශු දේහයෙන් වෙන්වීම, ප්‍රවාහනය වීම හා තැන්පත් වීමයි.
(ii) තැන්පත් වීම, ප්‍රවාහනය හා පස් අංශු දේහයෙන් වෙන්වීමයි.
(iii) ප්‍රවාහනය, තැන්පත්වීම හා පස් අංශු දේහයෙන් වෙන්වීමයි.
(iv) පස් අංශු දේහයෙන් වෙන්වීම, තැන්පත් වීම හා ප්‍රවාහනය වීමයි.

12. පියුරේරියා, ඩෙස්මෝඩියම් හා සෙන්ට්‍රොසිමා පියුබසන්ස් ශාක අයත් වන්නේ,
(i) කෙඳි බෝග කාණ්ඩයට ය. (ii) කොළ පොහොර කාණ්ඩයට ය.
(iii) විසිතුරු පත්‍රිකා කාණ්ඩයට ය. (iv) ආවරණ බෝග කාණ්ඩයට ය.

13. ද්විපද නාමකරණයේ දී මුලින් හැඳින්වෙන පදය නම්,
(i) ගණ නාමය යි. (ii) සුළු නාමය යි. (iii) ප්‍රභේද නාමයයි. (iv) කුල නාමය යි.

14. කෘෂිකර්මාන්තයේ දී බිම් සකස් කිරීමේ අරමුණු පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - පසේ භෞතික තත්ත්ව දියුණු කිරීම.
B - පසේ කැටායන හුවමාරු ධාරිතාව වැඩි කිරීම.
C - පසට පොහොර මිශ්‍ර කිරීම.
මෙයින් නිවැරදි වන්නේ
(i) A හා B පමණි. (ii) A හා C පමණි. (iii) B හා C පමණි. (iv) A, B හා C සියල්ල ම.

15. භාවිතා කරන අවස්ථාව අනුව බිම් සකස් කිරීමේ උපකරණ නිවැරදිව වර්ග කර ඇත්තේ,

| | ප්‍රාථමික බිම් සකස් කිරීම | ද්විතීයික බිම් සකස් කිරීම | අතුරු යත් ගෑම |
|---|---|---|---|
| (1) | උදැල්ල | උදැල්ල | උදැල්ල |
| (2) | තැටි නගුල | තුන් පුරුක් කල්ටිවේටරය | උදැල්ල |
| (3) | ඇලි වැටි දමනය | අත්පෝරුව | හෝවර්ග |
| (4) | පාමුල්ලුව | ජපන් පරිවර්තන නගුල | ජපන් රොටරි වීඩරය |

16. මුල්වලට අවම හානියක් සහිත ව ක්ෂේත්‍රයේ පැළ සිටුවා ගැනීම සඳහා සුදුසු තවාන් වර්ගය වන්නේ,
(i) උස්පාත්ති තවාන් ය. (ii) ගිල් වූ පාත්ති තවාන් ය.
(iii) නොරිදෝකෝ තවාන් ය . (iv) බඳුන් තවාන් ය.

17. වී වගාවේ දී භාවිත කරන තවාන් වර්ගයක් වන ඩැපොග් තවාන් ක්ෂේත්‍රයේ සිටුවීම සඳහා සුදුසු කාලය වන්නේ,
(i) තවාන් දමා දින 14 - 18 අතරදී ය. (ii) තවාන් දමා දින 12 - 14 අතරදී ය.
(iii) තවාන් දමා දින 10 - 12 අතරදී ය. (iv) තවාන් දමා දින 18 - 21 අතරදී ය.

18. පසක ලවණතාව ඉවත් කිරීම සඳහා යොදා ගත හැකි ජල සම්පාදන ක්‍රමයක් වනුයේ
(i) පිටාර ජල සම්පාදනයයි. (ii) ඇලි ජල සම්පාදනයයි.
(iii) විසිරි ජල සම්පාදනයයි. (iv) බිංදු ජල සම්පාදනයයි.

- අංක 19 හා 20 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන ක්‍රියාකාරකම් පාදක කර ගන්න.
  A - පසට වසුන් යෙදීම
  B - පසට රසායනික පොහොර මිශ්‍ර කිරීම
  C - වගා භූමියේ කාණු කපා ගල් අතුරා වසා දැමීම
  D - වල් පැළෑටි ඉවත් කිරීම

19. පාංශු ජල සංරක්ෂණ ක්‍රම ලෙස යොදා ගත හැක්කේ,
(i) A හා B පමණි (ii) A හා D පමණි (iii) B හා C පමණි (iv) C හා D පමණි

20. ජල වහනය සඳහා යොදා ගත හැකි ක්‍රියාකාරකමක් වනුයේ
(i) A ය. (ii) B ය. (iii) C ය. (iv) D ය.

21. ශාක බද්ධයක් සඳහා අනුජය තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු සම්බන්ධ ප්‍රකාශ තුනක් පහත දැක්වේ.
A - උසස් ගුණාත්මක බවින් යුතු මව්ශාකයකින් ලබා ගත යුතුයි.
B - ග්‍රාහක ශාකය අයත් කුලයේම ශාකයකින් ලබාගත යුතුයි.
C - ශක්තිමත් මූල පද්ධතියක් සහිත ශාකයකින් ලබාගත යුතුයි.
මෙයින් නිවැරදි ප්‍රකාශය වනුයේ
(i) A හා C ය. (ii) A හා B ය. (iii) B හා C ය. (iv) AB හා C සියල්ලම ය.

22. බඩ ඉරිඟු වගාවක ඌනතාවයක් ලෙස පහත ලක්ෂණ දක්නට ලැබුණි. මේරූ පත්‍ර කහ පැහැ වීම, වර්ධනය අඩු වී කුරු වීම, අස්වැන්න අඩු වීම, එසේ වීමට බලපාන පෝෂකය වන්නේ,
(i) නයිට්‍රජන් ය. (ii) පොස්පරස් ය. (iii) පොටෑසියම් ය. (iv) කැල්සියම් ය.

23. එක්තරා පොහොර වර්ගයක් රතු, දුඹුරු පැහැති කුඩා ස්ඵටික හා ජලයේ හොඳින් දියවීම සිදු වේ. මෙම ලක්‍ෂණ ඇති පොහොර වර්ගය වන්නේ,
(i) සල්ෆේට් ඔෆ් පොටෑෂ්ය. (ii) මියුරියේට් ඔෆ් පොටෑෂ්ය.
(iii) ත්‍රිපල් සුපර් පොස්පේට්ය. (iv) රොක් පොස්පේට්ය.

24. ශාක පෝෂක වර්ගීකරණයේ දී මහා පෝෂක හා ක්ෂුද්‍ර පෝෂක ලෙස වර්ග කර දක්වයි. මහා පෝෂක කාණ්ඩයට අයත් වන පිළිතුර වන්නේ
(i) නයිට්‍රජන්, පොස්පරස්, කොපර් (ii) හයිඩ්‍රජන්, පොටෑසියම්, කොපර්
(iii) කැල්සියම්, මැග්නීසියම්, සල්ෆර් (iv) යකඩ, මැග්නීසියම්, සල්ෆර්

25. කෘෂි කර්මාන්තයේ දී වල් පැළෑටි පාලනය සඳහා විවිධ ක්‍රම භාවිත කරයි. ඒ අතුරින් යාන්ත්‍රික ක්‍රමයක් වන්නේ,
(i) මනා ලෙස බිම් සැකසීම. (ii) ආවරණ බෝග වගා කිරීම.
(iii) වල් පැළෑටි ආහාරයට ගන්නා ජීවීන් යොදා ගැනීම. (iv) අතින් උදුරා දැමීම.

26. බොහෝ පලතුරු සහ එළවළු වර්ගවලට වැළඳෙන ඇන්ත්‍රැක්නෝස් නම් රෝගයට හේතු වන රෝග කාරකය කුමක්ද?
(i) දිලීර (ii) වෛරස (iii) බැක්ටීරියා (iv) වටපණුවන්

27. රූප සටහනේ දැක්වෙන්නේ ඉල්මැස්සා පාලනය සඳහා යොදා ගන්නා පෙරමෝන උගුලකි.
මෙහි A ලෙස ඇති ද්‍රව්‍ය නම්,
(i) සර්ජිකල් ගැල් වූ පුළුන් ය
(ii) මීතයිල් ඉයුජිනෝල් ගැල් වූ පුළුන් ය.
(iii) ඉන්ඩොල් ඇසිටික් ඇසිඩ් ගැල් වූ පුළුන් ය.
(iv) මාර්ෂල් 20 ගැල් වූ පුළුන් ය.




28. ගොවි මහතකුගේ වම්බටු වගාවක පත්‍රවල තැනින් තැන දැලක් සේ දිස්වන අයුරින් කෘමියෙකු විසින් හානි කර ඇති බව දක්නට ලැබුණි. මෙම කෘමියා නම්
(i) අවුලකපෝරා ය. (ii) එපිලැක්නා ය. (iii) දුඹුරු පැල කීඩෑවා ය. (iv) ඉල්මැස්සා ය.

29. ශිෂ්‍යයෙකු ඉදුණු තක්කාලි ගෙඩියකින් ලබාගත් බීජ ප්‍රතිකාරයකින් **තොරව** තවාන් කළ නමුත් නියමිත කාලපරාසයේ දී එම බීජ ප්‍රරෝහණය නොවීය. මීට හේතු විය හැක්කේ
(i) ඝණ බීජාවරණ තිබීමයි. (ii) අපාරගම්‍ය බීජාවරණ තිබීමයි
(iii) නිශේධක ද්‍රව්‍ය තිබීමයි. (iv) කලල අක්‍රීයව පැවතීමයි.

30. පෙට්‍රීදීසි ක්‍රමයට බීජ ප්‍රරෝහණ ප්‍රතිශතය සෙවීමේ පරීක්ෂණයක් සඳහා බීජ 80ක් යොදා ගන්නා ලදී. එයින් බීජ 60ක් ප්‍රරෝහණය විය. මෙම බීජ නියැදියේ ප්‍රරෝහණ ප්‍රතිශතය
(i) 45% කි. (ii) 60% කි. (iii) 75% කි. (iv) 85% කි.

31. මුල් කැබලි වලින් ප්‍රචාරණය කරගත හැකි බෝග අයත් කාණ්ඩය වන්නේ
(i) බිගෝනියා, පෙපරෝමියා, කහ වේ. (ii) එඬරු, ඉඟුරු, අක්කපාන, වේ.
(iii) ගොටුකොළ, ස්ට්‍රෝබෙරි, අර්තාපල් වේ. (iv) දෙල්, බෙලි, කරපිංචා වේ.

32. මේරීමේ අවධිය අනුව සිටුවීම සඳහා ගන්නා දඬු කැබලි, ලා දඬු, අඩදළ දඬු හා දළ දඬු වශයෙන් ආකාර තුනකි. පහත දැක්වෙන ශාක අතුරෙන් ලා දඬු කැබලි යොදා ගනිමින් ප්‍රචාරණය කරනුයේ

(i) මඤ්ඤොක්කා ය. (ii) බතල ය. (iii) ක්‍රෝටන් ය. (iv) බෝගන්විලා ය.

33. සෑම වී ප්‍රභේදයක් සඳහාම සමාන කාලසීමාවක් පවතින්නේ ගොයම් පැළෑටියේ කුමන වර්ධන අවධි වල ද?

(i) වර්ධක අවධිය හා ප්‍රජනන අවධියේ ය. (ii) වර්ධක අවධිය හා මේරීමේ අවධියේ ය.

(iii) ප්‍රජනක අවධිය හා මේරීමේ අවධියේ ය. (iv) වර්ධක අවධියේ පමණි.

34. ශ්‍රී ලංකාවේ බතලගොඩ මධ්‍යම වී අභිජනන මධ්‍යස්ථානය මගින් ගොවීන්ට හඳුන්වා දුන් පළමු දෙමුහුම් වී ප්‍රභේදය වන්නේ,

(i) Bg 300 ය. (ii) H4 ය. (iii) Bg 8/34 ය. (iv) Bg 3-5 ය.

35. පාලිත තත්ත්ව යටතේ බෝග වගා කිරීමේ වැදගත්කම පිළිබඳ ප්‍රකාශ කීපයක් පහත දැක්වේ.

A - බෝගයට අවශ්‍ය පරිසර සාධක ප්‍රශස්තව ලබාදෙන බැවින් වැඩි අස්වැන්නක් ලබාගත හැකිවේ.

B - රෝග හා පළිබෝධ හානි අවම වන බැවින් අස්වනු වල ගුණාත්මක බව වැඩිවේ.

C - මූලික වියදම අඩු නිසා ලබා ගත හැකි ලාබය වැඩිවේ.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ,

(i) A හා B ය. (ii) A හා C ය. (iii) B හා C ය. (iv) A, B හා C ය.

36. ශ්‍රී ලංකාවේ පහතරට ප්‍රදේශවල පොලිතීන් ගෘහ තුළ බෝග වගා කිරීමේ දී ඇතිවන බරපතල ගැටළුවක් වන්නේ,

(i) ජල හිඟය නිසා බෝග අස්වැන්න අඩුවීම යි.

(ii) සුළං අධික කාලයේ දී පොලිතීන් ගෘහ වලට හානි සිදුවීම යි.

(iii) රෝපණ මාධ්‍ය සපයා ගැනීමේ දුෂ්කරතා පැවතීම යි.

(iv) උෂ්ණත්වය වැඩිවීම පාලනය කිරීම සඳහා උපක්‍රම යෙදිය යුතු වීමයි.

37. සමෝධානිත ගොවිතැන් ක්‍රමය සඳහා ආකෘතියක් පහත සටහනේ දක්වා ඇත.




ඉහත A ස්ථානයට සුදුසුම ඒකකය විය හැක්කේ,

(i) තෘණ වගා ඒකකය

(ii) ජීව වායු ඒකකය

(iii) වන වගා ඒකකය

(iv) කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ඒකකය

38. ගොවි මහතෙක් තම පොල්වගාව අතර ගම්මිරිස් හා අන්නාසි ක්‍රමවත් ව නිසි පරතරයකට අනුව වගාකර තිබුණි. මෙය,

(i) මිශ්‍ර බෝග වගාව කි. (ii) කඩින් කඩ වගාවකි.

(iii) අතුරු බෝග වගාවකි (iv) ශෂ්‍ය මාරු වගාවකි.

39. සාපේක්ෂ ආර්ද්‍රතාවය අඩුවීම මගින් සමහර බෝග අස්වනු වලට සිදුවන බලපෑම සඳහන් පිළිතුර තෝරන්න.

(i) අර්තාපල් ආකන්ද කොළ පැහැයට හැරීම ය. (ii) වැල්දොඩම් වල ඵල හැකිලීම ය.

(iii) තක්කාලි ගෙඩිවල රතු පැල්ලම් ඇතිවීම ය. (iv) අඹ ගෙඩි ඇඹුල් රසයෙන් යුක්ත වීම ය.

40. බෝග අස්වනු නෙළීමේ සිට පරිභෝජනය දක්වා වූ පියවරයන් පහත වගුවේ දක්වා ඇත.

| | පියවර - 1 | පියවර - 2 | පියවර - 3 | පියවර - 4 | පියවර - 5 | පියවර - 6 |
|---|---|---|---|---|---|---|
| A | නෙළීම | ඇසිරීම | සැකසීම | ප්‍රවාහනය | ගබඩා කිරීම | අලෙවි කිරීම |
| B | නෙළීම | ගබඩා කිරීම | සැකසීම | ඇසිරීම | ප්‍රවාහනය | අලෙවි කිරීම |
| C | නෙළීම | සැකසීම | ඇසිරීම | ප්‍රවාහනය | ගබඩා කිරීම | අලෙවි කිරීම |
| D | නෙළීම | සැකසීම | ප්‍රවාහනය | ගබඩා කිරීම | ඇසිරීම | අලෙවි කරීම |

ඉහත වගුවට අනුව නිවැරදි අනුපිළිවෙල දැක්වෙන පිළිතුර වනුයේ,

(i) A ය. (ii) B ය. (iii) C ය. (iv) D ය.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

81 | S | II

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 11 - 2020

### කෘෂි හා ආහාර තාක්ෂණය - II

- <u>පළමුවැනි</u> ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න <u>හතරක්</u> ඇතුළුව ප්‍රශ්න <u>පහකට පමණක්</u> පිළිතුරු සපයන්න.

01. පුරං කුඹුරු අස්වැද්දීමේ ජාතික වැඩසටහන යටතේ උතුරු හා උතුරු මැද පළාත්වලට අයත් ප්‍රදේශ තුළ මෙවර මහ කන්නයේ දී හෙක්ටයාර් 10,000ක වී සහ අතිරේක ආහාර බෝග වගා කිරීමට සැලසුම් කර ඇත.
   (i) a. මහ කන්නයේ දී ප්‍රධාන වශයෙන් ඉහත ප්‍රදේශ වලට වැසි ලැබෙන ක්‍රමය කුමක් ද?
   b. මහ කන්නයට අයත් වගා කාලසීමාව දක්වන්න.
   (ii) a. වී වගාව සඳහා මූලික බිම් සැකසීමේදී යොදාගන්නා රෝද දෙකේ ට්‍රැක්ටරයට සම්බන්ධ කරන කෘෂි උපකරණයක් නම් කරන්න.
   b. නියර මඩ තැබීමේ අරමුණ කුමක් ද?
   (iii) බිත්තර වී වල තිබිය යුතු උපරිම තෙතමන ප්‍රතිශතය හා අවම පැලවීමේ ප්‍රතිශතය සඳහන් කරන්න.
   (iv) පසක ඇති ආම්ලිකතාවය උදාසීන කිරීම සඳහා යොදාගත හැකි ද්‍රව්‍ය දෙකක් සඳහන් කරන්න.
   (v) ඉහත ප්‍රදේශ වල වගා කිරීමට සුදුසු ෆැබේසියේ කුලයේ බෝග වර්ග 4ක් ලියන්න.
   (vi) අතිරේක ආහාර බෝගයක් ලෙස මිරිස් වගාව ආරම්භ කිරීමට තවාන් පාත්ති සැකසීමේ දී ජීවාණුහරණය කිරීමේ ක්‍රම දෙකක් ලියන්න.
   (vii) බෝග වගාවට හානිකරන පළිබෝධ සතුන්ගේ ස්වභාවික සතුරන් දෙදෙනෙක් නම් කරන්න.
   (viii) බෝග වගාවේ දී ඇතිවිය හැකි වෛරස් රෝගවල පොදු ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
   (ix) වී වගාවේ දී භාවිතාවන පිටාර ජල සම්පාදන ක්‍රමයේ වාසි දෙකක් ලියන්න.
   (x) යන්ත්‍ර මගින් වී අස්වනු නෙළීමේ දී සිදුවන අවාසි දෙකක් සඳහන් කරන්න.

02. ප්‍රදේශයට ගැළපෙන බෝග තෝරා ගැනීමටත්, අස්වනු වැඩිකර ගැනීමටත්, වගා පාළු අවම කරගැනීමටත්, පරිසර සාධක පිළිබඳව දැන සිටීම වැදගත් වේ.
   (i) a. කාලගුණය යන්න අර්ථ දක්වන්න.
   b. කාලගුණික පරාමිති 4ක් නම් කර ඒවා මැනීම සඳහා භාවිතා කරන උපකරණ වෙන වෙනම ලියා දක්වන්න.
   (ii) බෝග වගාව කෙරෙහි වායුගෝලයේ පවතින ජල වාෂ්ප ප්‍රමාණය වැඩිවීමෙන් ඇතිවන හිතකර හා අහිතකර බලපෑම් 2 බැගින් ලියන්න.
   (iii) a. ප්‍රධාන දේශගුණික කලාප නම් කරන්න.
   b. කෘෂි පාරිසරික කලාප වර්ගීකරණයේ වැදගත්කම් තුනක් සඳහන් කරන්න.

03. කෘෂිකර්මාන්තයේ දී බෝග වගා කෙරෙන ප්‍රධාන වගා මාධ්‍ය ලෙස පස මගින් ඉටුකෙරෙන කාර්යභාරය ඉතාමත් සුවිශේෂී වේ.
   (i) a. පාංශු පැතිකඩ යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න.
   b. දර්ශීය පාංශු පැතිකඩක කාබනික ද්‍රව්‍ය අඩංගු විය හැකි කලාප නම් කරන්න.
   c. පස තුළ පවතින කලිල වර්ග දෙකක් සඳහන් කරන්න.
   (ii) a. පාංශු ව්‍යුහය යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න.
   b. ශ්‍රී ලංකාවේ දැකිය හැකි පාංශු ව්‍යුහ ආකාර හතරක් නම් කරන්න.
   c. පාංශු ව්‍යුහ අතුරින් බෝග වගාව සඳහා වඩාත් සුදුසු ව්‍යුහය නම් කරන්න.
   (iii) a. පාංශු ඛාදනයට හේතුවන සාධක හතරක් සඳහන් කරන්න.
   b. පාංශු ඛාදනයේ අහිතකර ප්‍රතිඵල 2ක් ලියන්න.

04. බෝග අස්වනුවල ගුණාත්මයට හා ප්‍රමාණයට හානි සිදුවීම පළිබෝධ නිසා සිදුවේ. පළිබෝධ ලෙස හඳුනාගෙන ඇති වල්පැලෑටි, රෝග කාරක සහ කෘමීන් මගින් ඇති කරන හානි අවම කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු ය.

(i) a. වල් පැළෑටි නිසා බෝගවලට සිදුවන හානි හතරක් ලියන්න.

b. රූපාකාරය අනුව වල් පැළෑටි වර්ග කර උදාහරණ එක බැගින් දක්වන්න.

(ii) a. පූර්ණ රූපාන්තරණය යන්න පැහැදිලි කරන්න.

b. පූර්ණ රූපාන්තරණයක් සහිත කෘමීන් දෙදෙනෙකු නම් කරන්න.

(iii) a. නිවසේ දී සාදා ගත හැකි පළිබෝධ නාශක වර්ග දෙකක් ලියන්න.

b. රසායනික පළිබෝධ නාශක භාවිතයේ ගැටලු 4ක් දක්වන්න.

05. වර්තමානයේ දී බෝග වගාව සඳහා පොහොර භාවිතය පිළිබඳ ව අවබෝධයෙන් කටයුතු කිරීම මගින් අස්වනු වැඩි කර ගත හැකි බව පෙන්වා දී ඇත.

(i) a. කාබනික පොහොර භාවිත කිරීමේ වැදගත්කම් හතරක් දක්වන්න.

b. ගොවිපළේ දී ම සාදා ගත හැකි දියර පොහොර වර්ග දෙකක් ලියන්න.

(ii) a. පසට පොහොර යොදන ක්‍රම තුනක් සඳහන් කරන්න.

b. අමිශ්‍ර පොහොර යෙදීමේ වාසි තුනක් ලියන්න.

(iii) a. රසායනික පොහොර භාවිතයෙන් වන අහිතකර බලපෑම් දෙකක් සඳහන් කරන්න.

b. ඒකාබද්ධ ශාක පෝෂක කළමනාකරණය (IPNS) ලෙස හඳුන්වන්නේ කුමක් ද?

06. බෝග වගාවේ දී ලිංගික හා අලිංගික ක්‍රමවලට සිදුවන ශාක ප්‍රචාරණය පිළිබඳව දැන සිටීම වැදගත් වේ.

(i) a. බීජ සුප්තතාව හෙවත් බීජ අක්‍රියතාව යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

b. බෝග වගාවේදී බීජ සුප්තතාව ගැටලුවක් වුවද ඇතැම් අවස්ථාවල එය ප්‍රයෝජනවත් ලක්ෂණයක් වේ. එවැනි ප්‍රයෝජනවත් අවස්ථාවක් සඳහා නිදසුනක් දෙන්න.

c. බීජ මගින් ශාක ප්‍රචාරණය කිරීමේ අවාසි දෙකක් ලියන්න.

(ii) රතුළූණු, අර්තාපල්, ඉඟුරු සහ කිරි අල යන බෝග ප්‍රචාරණය සඳහා යොදාගනු ලබන ස්වභාවික ප්‍රචාරක ව්‍යුහ වෙන් වෙන්ව ලියන්න.

(iii) පටක රෝපණයේ වාසි දෙකක් ලියන්න.

07. බෝග වගාවේ දී පරිසර තත්ත්ව පාලනය කිරීම සඳහා තාවකාලික හා ස්ථිර ආරක්ෂිත වගා ව්‍යුහ භාවිතා කරයි.

(i) a. තාවකාලික ආරක්ෂිත වගා ව්‍යුහයක් වන සූර්ය ප්‍රචාරකය තුළින් පාලනය කර ගත හැකි පරිසර සාධක දෙකක් සඳහන් කරන්න.

b. සූර්ය ප්‍රචාරකයක් සඳහා මාධ්‍ය වශයෙන් භාවිතා කළ හැකි ද්‍රව්‍ය 4ක් සඳහන් කරන්න.

(ii) ඒකීය සූර්ය ප්‍රචාරකයක් සකස් කරගන්නා ආකාරය රූපසටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(iii) a. ස්ථිර ආරක්ෂිත වගා ව්‍යුහයක් වන පොලිතීන් ගෘහයක් තුළ බෝග වගා කිරීමෙන් ලබාගත හැකි වාසි දෙකක් ලියන්න.

b. පොලිතීන් ගෘහ තුළ උෂ්ණත්වය වැඩිවීම පාලනය කිරීම සඳහා යොදාගත හැකි උපක්‍රම දෙකක් සඳහන් කරන්න.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**Answer**

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

81 | S | I-II

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 11 - 2020

### කෘෂි හා ආහාර තාක්ෂණය - පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 1 | 21. | 2 | 31. | 4 |
| 02. | 3 | 12. | 4 | 22. | 1 | 32. | 2 |
| 03. | 1 | 13. | 1 | 23. | 2 | 33. | 3 |
| 04. | 3 | 14. | 2 | 24. | 3 | 34. | 2 |
| 05. | 3 | 15. | 1 | 25. | 4 | 35. | 1 |
| 06. | 2 | 16. | 3 | 26. | 1 | 36. | 4 |
| 07. | 4 | 17. | 3 | 27. | 2 | 37. | 2 |
| 08. | 2 | 18. | 1 | 28. | 2 | 38. | 3 |
| 09. | 3 | 19. | 2 | 29. | 3 | 39. | 2 |
| 10. | 2 | 20. | 3 | 30. | 3 | 40. | 3 |

(ල. - 1 × 40 = 40)

### II කොටස

01. (i) a. ඊසාන දිග මෝසම් සුළං මගින් ල. 01
b. ඔක්තෝබර් සිට පෙබරවාරි දක්වා
ල. 1/2 × 2 = 01

(ii) a. ජපන් පරිවර්ත්‍ය නගුල, හැඩ ලැලි නගුල (මෝල්බෝඩ් නගුල) ල. 01
b. ලියද්දේ ජලය රඳවා තබා ගැනීමට ල. 01

(iii) * උපරිම තෙතමන ප්‍රතිශතය - 13% ල. 01
* අවම පැලවීමේ ප්‍රතිශතය - 85% ල. 01

(iv) * කැල්සියම් කාබනේට් ($CaCo_3$)
ඩොලමයිට් ($CaCo_3$, $MgCo_3$)
* අළු හුණු (CaO) ල. 02

(v) * මුං, කව්පි, උඳු, සෝයා බෝංචි, මෑ, දඹල, ගස් බෝංචි, තෝර පරිප්පු, රටකජු
ල. 1/2 × 4 = 02

(vi) * සූර්ය තාපය මගින්
* පිළිස්සීම මගින්
* උණු ජලය යෙදීම මගින්
* රසායනික ද්‍රව්‍ය භාවිතයෙන් ල. 02

(vii) * දිමියන්, බත්කූරන්, ලේඩිබර්ඩ්, කුරුමිණියන්, මකුළුවන්, කුරුල්ලන්, ඉබි කුරුමිණියන්, වන්දා, කීඩෑ මරුවා බෝතල් කුරුමිණියා (තවත් නිවැරදි පිළිතුරු සඳහා) ල. 02

(viii)* පත්‍ර කහ පාට වීම * ශාක කුරු වීම
* පත්‍ර නාරටි බේරීම * පත්‍ර, පුෂ්ප හා ඵල විකෘති වීම * පත්‍ර විචිත්‍රය * පත්‍ර සෙව්වන්දියන් ඇතිවීම

(ix) * මූලික වියදම අඩුය.
* විශේෂ තාක්ෂණික දැනුමක් අවශ්‍ය නොවේ.
* වල් පැළ මර්දනය සඳහා ද සුදුසු වේ.
* පසේ ලවණතාවය ඉවත් කිරීමට ද යොදාගත හැක. ල. 02

(x) * අස්වනු නාස්තිය සිදු වේ.
* මඩ කුඹුරුවල ක්‍රියාත්මක කිරීම අපහසු ය.
* යන්ත්‍රවල මිල අධික ය.
* කුඩා ක්ෂේත්‍ර සඳහා යෙදිය නොහැකි ය.
ල. 02

මුළු ලකුණු 20

02. (i) a. යම් ප්‍රදේශයක කෙටි කාලයක් තුළ වායුගෝලයේ පවතින ස්වභාවය ල. 01
b. වර්ෂාපතනය - වර්ෂාමානය
උෂ්ණත්වය - උෂ්ණත්ව මානය
ආලෝකය - සූර්ය විකිරණ මානය/සූර්ය දීප්තමානය
සාපේක්ෂ ආර්ද්‍රතාවය - තෙත් හා වියලි බල්බ උෂ්ණත්ව මානය/ආර්ද්‍රතාමානය
සුළඟ - අනිල මානය
පරාමිතිවලට ල. 1/2 × 4 = 02
උදාහරණවලට ල. 1/2 × 4 = 02 } 04

(ii) **හිතකර බලපෑම්**
* දඬු කැබලි මුල් ඇද්දවීම හොඳින් සිදුවේ
* පරාගනයේ දී කලංකය ග්‍රාහීය වීම.
* විසිතුරු ශාක හොඳින් වර්ධනය වේ.
ල. 1/2 × 2 = 01

**අහිතකර බලපෑම්**
* ශාකරෝග ආසාදන වැඩිවේ.
* පළිබෝධ ව්‍යාප්තිය වැඩිවේ.
* උත්ස්වේදනය අඩුවීම නිසා ජලය හා පෝෂක අවශෝෂණය අඩුවේ.
* සුළඟ මගින් පරාග විසිරියාමට බාධා ඇතිවේ.
* ගබඩා බීජ පළිබෝධ හානිවලට ලක්වේ.
ල. 1/2 × 2 = 01

(iii) a. * තෙත් කලාපය * අතරමැදි කලාපය
* වියලි කලාපය ල. 1/2 × 3 = 1 1/2
b. * සමාන දේශගුණික තත්ත්ව ඇති ප්‍රදේශ හඳුනා ගැනීමට

* යළ මහ කන්නවල කාලසීමා අනුව වගා කටයුතු සැලසුම් කිරීමට
* ඒ ඒ කලාපයට සුදුසු බෝග නිර්දේශ කළ හැකිවීම.
*ඉඩම් සංවර්ධන හා සංරක්ෂණ කටයුතු පහසුවීමට.
* කෘෂිකාර්මික ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම පහසු වීමට.

ල. 1/2 × 3 = 1 1/2

මුළු ලකුණු 10

03. (i) a. පස මතුපිට සිට මව් පාෂාණය දක්වා කලාප පෙන්නුම් කරන පසේ සිරස්කඩයි. ල. 01

b. 0 සහ A කලාප ල. 1/2 × 2 = 01

c. කාබනික කලිල සහ අකාබනික කලිල ල. 1/2 × 2 = 01

(ii) a. ස්වාභාවික තත්ත්ව යටතේ පස් අංශු එකට එකතු වී සෑදී ඇති පස් සමූහන වල රූපාකාරය හෙවත් ස්වරූපයයි. (සමාන අර්ථයක් දෙන පිළිතුරු සඳහා ලකුණු දෙන්න.) ල. 01

b. * තනි කණිකා
* ස්ථම්භික
* අණු කෝණාකාර කුට්ටි
* කැටිති ල. 1/2 × 4 = 02

c. කැටිති ව්‍යුහය ල. 01

(iii) a. * වර්ෂා ජලය
* වේගවත් සුළඟ
*මුහුදු රළ හා ගංගා රළ
* මිනිසුන්ගේ හා සතුන්ගේ ක්‍රියාකාරකම් ල. 1/2 × 4 = 2

b. * ශාක වර්ධනය සඳහා සුදුසු පාංශු ස්ථරයේ ඝනකම අඩුවේ.
*ශාක පෝෂණ ඌනතා වලට ගොදුරු වී වර්ධනය බාල වේ.
* මූල මණ්ඩල අවට පස සෝදායාම නිසා ගස් ඇද වැටේ.
*කෘෂි කාර්මික ඉඩම්වල වටිනාකම අඩුවේ.
* ජලාශවල පස් තැන්පත්වීම නිසා ඒවා ගොඩවීමෙන් ගංවතුර ඇතිවේ.

ල. 1/2 × 2 = 01

මුළු ලකුණු 10

04. (i) a. 1. පොහොර, ආලෝකය, ජලය, ඉඩකඩ සඳහා තරගකාරිත්වය
2. අස්වැන්නේ ගුණාත්මය අඩුවීම
3. ක්ෂේත්‍ර කටයුතු අපහසු වීම
4. රෝග කාරක සඳහා ධාරක ශාක වීම
5. ජල සම්පාදන අවම වීම.
6. වගා බිම්වල වටිනාකම අඩුවීම.

1/2 × 4 = 2

b. **පළල් පත්‍ර** - මොනරකුඩුම්බිය, කුප්පමේනියා, ජපන් ජබර, දිය හබරල
**තෘණ** - බැලතණ, ඇටවරා, බටදැල්ල
**පන්** - කලාඳුරු, තුන්හිරියා 1/2 × 6 = 3

(ii) a. කෘමීන්ගේ ජීවන චක්‍රයේ බිත්තර, කීට, පිලවා සහ සුහුඹුල් ලෙස අවධි 4ක් දැකිය හැකිවීම. 1

b. සමනලයන්, සලබයන්, කුරුමිණියන් 1/2 × 2 = 1

(iii) a. කොහොඹ ඇට සාරය, සුදුළූණු ජලය දුම්කොළ නැටි සාරය 1/2 × 2 = 1

b. හිතකර ජීවීන් ද විනාශ වීම.
ජල මූලාශ්‍ර දූෂණය වීම 1/2 × 4 = 2
මිනිසුන්ට විෂ සහිත වීම, වායු දූෂණය

05. (i) a. සියලු ම පෝෂ්‍ය පදාර්ථ අඩංගු වේ.
පසේ කැටායන හුවමාරු ධාරිතාව වැඩි කරයි.
දිගු කාලයක් පසට පෝෂක නිදහස් කරයි.
පාංශු ව්‍යුහය දියුණු කරයි.
ජල අවශෝෂණ ධාරිතාව වැඩි කරයි.
ක්ෂුද්‍රජීවී ගහනය වැඩි කරයි. ආදී ලෙස ල. 02

b. ගැඩවිල් පණු දියරය, මත්ස්‍යය තෛලෝදය
කුකුල් පොහොර නිස්සාරණය
කොළ පොහොර නිස්සාරණය ල. 02

(ii) a. ඉසීම/ අවට යෙදීම/ පේළියට යෙදීම /ජල සම්පාදනය සමග දිය කර යෙදීම /තැනින් තැන වළවල් සකස් කර ඒවා තුළට පොහොර යෙදීම. ල. 1/2 × 3 = 1.5

b. බෝගයේ අවශ්‍යතාවය අනුව යෙදිය හැක. මිලෙන් අඩුය. /යෙදීම පහසුය /ගබඩා කිරීමට අඩු ඉඩක් වැය වේ. ප්‍රවාහනය පහසුය. ල. 1/2 × 3 = 1.5

(iii) a. දිගටම යෙදීමෙන් පසේ pH අගය අහිතකර විය හැක./වැඩියෙන් යෙදුවහොත් ශාක මිය යා හැක. /මිල අධිකය/භූගත ජල ප්‍රභව දූෂණය විය හැක. ල. 02

b. කාබනික පොහොර යොදා පසෙහි භෞතික, රසායනික, ජෛව ලක්ෂණ දියුණු කරමින් බෝගයේ පෝෂණ අවශ්‍යතාවයට රසායනික පොහොර යෙදීම. ල. 01

06. (i) a. මේරූ ජීවී බීජයකට ප්‍රරෝහණය වීමට අවශ්‍ය සාධක ලැබී තිබියදීත් එය ප්‍රරෝහණය නොවීමයි. ල. 1 × 1

b. සුප්තතාව නිසා බීජ එළතුළ පැළ වීම වැලකීම.
සුප්තතාව බීජ දීර්ඝ කාලයක් පරිසරයේ නොනැසී පැවතීම.
දීර්ඝ කාලයක් ගබඩා කර තබා ගැනීමට හැකිවීම.
අහිතකර පරිසර කාලතරණය කල හැකි වීම. ල. 1 × 1

c. අවාසි

* බීජ මගින් ලැබෙන දුහිතෘ පැලවල මවුශාකයේ ඇති හිතකර ලක්ෂණ අඩංගු නොවීම.

*බීජ පැළවීම ඒකාකාර නොවීම නිසා වගා බිමේ පාළු ඇතිවීම.

* වගාව ඒකාකාර නොවන නිසා පශ්චාත් සාත්තුව සිදු කිරීම අපහසු වීම.

* ශාක විශාලව වැඩෙන නිසා නඩත්තුව අපහසු වීම.

* ඵල හට ගැනීම ප්‍රමාද වීම.

*වසර පුරා පැල ලබා ගැනීමට නොහැකි වීම.

* බීජ නොනිපදවන ශාකවලට යොදා ගත නොහැකි වීම. 1 × 2

(ii) ස්වභාවික වර්ධක ව්‍යුහ

රතුළූණු - බල්බ ඉඟුරු - රෛසෝම

අර්තාපල් - ස්කන්ධ ආකන්ද කිරි අල - කෝම

ල. 04

(iii) *අධික පැල සංඛ්‍යාවක් ලබාගත හැකිවීම.

*නිරෝගී පැල ලබාගැනීම.

*මවු ශාකයට සමාන දුහිතෘ පැල ලබා ගැනීමට හැකිවීම.

*පැළ ගබඩා කිරීම, ප්‍රවාහනය පහසුවීම

* ඕනෑම කාලයක පැළ ලබා ගැනීමේ පහසුව

* බීජ හට නොගන්නා ශාක ප්‍රචාරණය කළ හැකිවීම. ල. 02

* රෝගී ශාකවලින් නිරෝගී ශාක පැල ලබාගත හැකි වීම.

**Answer**

07. (i) a. උෂ්ණත්වය, සාපේක්ෂ ආර්ද්‍රතාවය

ල. 1/2 × 2 = 01

b. මතුපිට පස්, කොම්පෝස්ට්, වැලි, කොහුබත්, ගොවිපල පොහොර ල. 1/2 × 4 = 02

(ii) a.




* පොලිතිනයේ පළල මෙන් 4-5 ගුණයක් දිගට කපාගෙන එක් කෙළවරක් සීල් කිරීම.

*බඳුනේ උසෙන් 1/3ක් තෙත් කළ මාධ්‍ය (වැලි, කොම්පෝස්ට්, මතුපිට පස් 1:1:1) පිරවීම

* දඬු කැබැල්ල සිටුවා ආධාරකය සවිකර වාතය පිරෙන්නට ගැට ගැසීම.

ල. රූපසටහනට - 02
විස්තරයට - 02 } 04

(iii) a. * ගුණාත්මක බවෙන් ඉහළ අස්වනු ලැබීම.

* රෝග, හානි නොමැති වීම.

* වල් පැලෑටි පාලනය අවශ්‍ය නොවීම.

* අවාරයේ අස්වනු ලබා ගත හැකිවීම.

* අස්වනු හානිය අඩු වීම

ල. 1/2 × 2 = 01

b. * රත්වන වාතය ඉවත් වන පරිදි වහලය සැකසීම.

*වහලයට හෝ පැති බිත්තිවලට පංකා සවි කිරීම.

* ගෘහය තුළ මීදුමක් ලෙස ජලය සැපයීම.

*පැති බිත්තිවලට පොලිතීන් වෙනුවට කෘමි ප්‍රතිරෝධී දැල් සවිකිරීම. ල. 1 × 2 = 02

මුළු ලකුණු 10